තුරුසවිය අරමුදල

වාර්ෂික වාර්තාව

2022



වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

තුරුසවිය අරමුදල

නෛතික තත්ත්වය - තුරුසවිය අරමුදල ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් 2000 අංක 23 දරන තුරුසවිය අරමුදල පනත මගින් ස්ථාපිත කරන ලද සංස්ථාවකි.

අනුබද්ධිත අමාත්‍යාංශය - වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

ලියාපදිංචි කාර්යාලය -තුරුසවිය අරමුදල

අංක 39

ශ්‍රී සුභූතිපුර

බත්තරමුල්ල.

ඇමතුම් තොරතුරු -

සභාපති - දූ.අ.011-2863937

අධ්‍යක්ෂ - දූ.අ.011-2863936

පොදු - දූ.අ.011-2863786

ෆැක්ස් - 011-2863786

ඊ මේල් - thurusaviya2000@gmail.com

වෙබ් අඩවිය - http://thurusaviya.gov.lk

සභාපතිතුමන්ගේ සමාලෝචනය

තුරුසවිය අරමුදලට, ආයතනික නිලධාරීන්ගේ හා ක්ෂේත්‍ර නිලධාරීන්ගේ කැපවීම ද, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ හා සහබද්ධ අනිකුත් රාජ්‍ය ආයතනවල සහයෝගය හා දායකත්වය ද ඇතිව 2022 වර්ෂයේ සැලසුම් කරන ලද කාර්යයන්ගෙන් වැඩි ප්‍රමාණයකට 80%කට වඩා වැඩි භෞතික ප්‍රගතියක් ළඟා කර ගත හැකි විය. තුරුසවිය සමිති වටා ඒකරාශීව සිටින කුඩා රබර් වතු හිමියන් වෙනුවෙන් ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමත්, සහනදායී පදනමින් උපකරණ ලබාදීම යටතේ කිරි පිහි බෙදා දීමත් සිදු කරන ලදී. වර්තමාන ආර්ථික අර්බුදය හේතුවෙන් ප්‍රාග්ධන ප්‍රතිපාදන ලැබීම ප්‍රමාද වුව ද වසර අග භාගයේ දී , නවීන දුම් කාමර ඉදිකිරීම සඳහා පහසුකම් සැලසීමත් රබර් කිරි අස්වනු සහායක ශිල්පීන් පුහුණු කිරීමත් යන විශේෂ වැඩසටහන් දෙක ක්‍රියාත්මක කිරීමට හැකිවිය.

තුරුසවිය අරමුදල දීර්ඝ කාලයක සිට සීමිත කාර්ය මණ්ඩලයක් යටතේ තුරුසවිය සමිති හරහා කුඩා රබර් වතු හිමියන්ට අවශ්‍ය පහසුකම් සලස්වමින් රබර් කර්මාන්තය වඩාත් ඵලදායීව හා කාර්යක්ෂමව සිදු කිරීමට අවශ්‍ය මඟ පෙන්වීම හා සහය ලබාදීම සිදු කරයි. මේ වන විට දීපව්‍යාප්තව පිහිටුවා ඇති තුරුසවිය සමිති 873 ක් හරහා කුඩා රබර් වතු හිමියන්ට ප්‍රතිලාභ ලබාදෙන අතර තුරුසවිය සමිති පිහිටුවමින්, ප්‍රතිලාභී කුඩා රබර් වතු හිමියන් සංඛ්‍යාව වසරින් වසර වැඩි කර ගනිමින් රබර් කර්මාන්තයේ තිරසාර සංවර්ධනයට දායක වීම අපගේ අභිප්‍රායයි.



විජිත ලොකුනාරංගොඩ

සභාපති

තුරුසවිය අරමුදල

අධ්‍යක්ෂතුමන්ගේ පණිවුඩය

තුරුසවිය අරමුදල කුඩා රබර් වතු හිමියන්ගේ අභිවෘද්ධියට අවැසි කටයුතු සම්පාදනය කරමින් රබර් කර්මාන්තයේ සංවර්ධනයට දීර්ඝ කාලයක් තිස්සේ සේවා සපයන ආයතනයකි. කුඩා රබර් ඉඩම් හිමියන්ගේ නිෂ්පාදනවල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම හා වෙළඳපොළ නැංවීම මඟින් රබර් කර්මාන්තයෙහි උපරිම ප්‍රතිලාභ ලබා ගැනීමටත්, කර්මාන්තයේ ආදායම් උච්චාවචනයන්ට ඔරොත්තු දිය හැකි පරිදි අමතර ආදායම් උත්පාදන මාර්ග හඳුන්වා දීම හා ප්‍රවර්ධනයත් තුරුසවිය අරමුදල විසින් සිදු කරනු ලබයි.

ශ්‍රී ලංකා රබර් කර්මාන්ත ප්‍රධාන සැලැස්ම (Sri Lanka Rubber Industry Master Plan) 2017 – 2026 එළිදැක්වීමත් සමඟ තුරුසවිය අරමුදල එම ජාතික න්‍යාය පත්‍රය අනුව යමින් රබර් කර්මාන්තයේ සංවර්ධනයට සෘජුවම බලපාන විශේෂිත ව්‍යාපෘති දෙකක් වන රබර් කිරි අස්වනු සහායක ශිල්පීන් පුහුණු කිරීමේ වැඩසටහන හා රබර් පර්යේෂණ ආයතනයෙන් හඳුන්වාදුන් නව තාක්ෂණයෙන් යුත් එක් දින වියළුම් කුටි තුරුසවිය සමිති සඳහා හඳුන්වා දීමේ වැඩසටහන ආරම්භ කරන ලදී.

කුඩා රබර් වතු හිමියන් රබර් කර්මාන්තය තුළ ස්ථාවරව රඳවා ගැනීමේ අභිප්‍රායෙන් හඳුනාගත් පරමාර්ථ ඔස්සේ සකසන ලද තුරුසවිය සමිති ව්‍යාප්ති වැඩසටහන හා එම සමිති වෙනුවෙන් හඳුන්වා දී ඇති පුහුණු වැඩසටහන් මඟින් කුඩා රබර් වතු හිමියන්ට අවශ්‍ය සේවා සැපයීම සිදු කරනු ලබයි. සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය ප්‍රාග්ධන ප්‍රතිපාදන ලැබීමේ ප්‍රමාදයක් වූ බැවින් වසර අග භාගයේ ආරම්භ කල ද විශේෂ ව්‍යාපෘති දෙකකින් මෙන්ම පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමෙන් ද සාධනීය ප්‍රගතියක් අත්පත් කර ගත හැකි විය.

මෙසේ තුරුසවිය අරමුදල හරහා, කුඩා රබර් වතු හිමියන් වැඩි පිරිසක් වෙනුවෙන් රබර් කර්මාන්තයේ ස්ථාවරව රැඳී සිටීමට අවැසි කර්මාන්තයක් උදෙසා වැඩි ඵලදායීත්වයකින් හා වැඩි අගයකින් යුත් සේවාවන් අඛණ්ඩව සැපයීම වෙනුවෙන් අපි කැප වී සිටින්නෙමු.



නීතීඥ ආචාර්ය කාංචන සිල්වා
අධ්‍යක්ෂ
තුරුසවිය අරමුදල

පටුන

1.	ආයතනයේ මූලික තොරතුරු	- i
2.	සභාපතිතුමන්ගේ සමාලෝචනය	- ii
3.	අධ්‍යක්ෂතුමන්ගේ පණිවුඩය	- iii
4.	දැක්ම සහ මෙහෙවර ප්‍රකාශය	- 01
5.	කළමනාකරණ මණ්ඩලය හා විගණන හා කළමනාකරණ කමිටුව	- 02 - 03
6.	තුරුසවිය අරමුදල කාර්යමණ්ඩලය 2022	- 04
7.	ආයතනික කාර්යභාරය, පරමාර්ථ හා උපාය මාර්ග	- 05 - 06
8.	2022 වසරේ ක්‍රියාකාරී සැලැස්ම ප්‍රකාරව ඉටු කරන ලද කාර්යයන්	- 07 - 14
9.	තුරුසවිය අරමුදල - ප්‍රගති සමාලෝචනය - 2022	- 15
10.	අවසන් ගිණුම් වාර්තාව - 2022	- 16 - 30
11.	විගණකාධිපති වාර්තාව 2022	- 31 - 37

දැක්ම සහ මෙහෙවර ප්‍රකාශය

දැක්ම

දේශීය රබර් කර්මාන්තය ශ්‍රී ලංකාවේ පළමු පෙළේ විදේශ විනිමය උපයන කර්මාන්තයක් බවට පත් කිරීම.

මෙහෙවර

රබර් කර්මාන්තයේ වැඩි ඵලදායිතාවය හා ගුණාත්මක බව වැඩි දියුණු කිරීම මඟින් කුඩා රබර් ඉඩම් හිමියන්ගේ ආර්ථික තත්ත්වය නංවාලීමට කටයුතු කිරීමෙන් සමස්ත දේශීය රබර් කර්මාන්තය ශක්තිමත් කිරීම හා ඔවුන් රටේ සංවර්ධනයට දායක කර ගැනීම.

තුරුසවිය අරමුදලේ හර වටිනාකම්

- සන්තුෂ්ටිය
- ඒකාබද්ධතාවය
- සුරක්ෂිතතාවය
- සේවක සන්තුෂ්ටිය
- ගුණාත්මකභාවය

කළමනාකරණ මණ්ඩලය හා විගණන හා කළමනාකරණ කමිටුව

තුරුසවිය අරමුදල කළමනාකරණ මණ්ඩලය - 2022

1. විජිත ලොකුනාරංගොඩ මහතා - සභාපති
   සභාපති,
   තුරුසවිය අරමුදල
2. මාධව වර්ණකුලසූරිය මහතා - සාමාජික
   අධ්‍යක්ෂ ජනරාල්,
   රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව
3. එන්.පී.කුමාරගේ මිය - නිරීක්ෂක
   අධ්‍යක්ෂක,
   මුදල් අමාත්‍යාංශය
4. ජී.ඩී.ටී.එස්. පෙරේරා මහතා - සාමාජික
   ප්‍රධාන ගණකාධිකාරී,
   වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
5. මහාචාර්ය සුධීරා රන්වල මහත්මිය - සාමාජික
   සභාපති,
   ශ්‍රී ලංකා රබර් පර්යේෂණ ආයතනය
6. තුෂාර ප්‍රියදර්ශන මහතා - සාමාජික
   සභාපති,
   කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය
7. ඩී.ඩී.කේ චන්ද්‍රකීර්ති මහතා - සාමාජික
   සභාපති,
   ශ්‍රී ලංකා කුඩා රබර් වතු සංවර්ධන සම්මේලනය
8. රෝහණ ගලබඩ මහතා - සාමාජික
   සභාපති,
   කළුතර දිස්ත්‍රික් තුරුසවිය ප්‍රාදේශීය සංවිධානය
9. බී.ඒ.එස්.කේ. ප්‍රේමරත්න මහතා - සාමාජික
   සභාපති,
   කෑගල්ල දිස්ත්‍රික් තුරුසවිය ප්‍රාදේශීය සංවිධානය
10. ජේ.ඩී.එස්. වික්‍රමරත්න මහත්මිය - සාමාජික
    සභාපති,
    කොළඹ දිස්ත්‍රික් තුරුසවිය ප්‍රාදේශීය සංවිධානය
11. දිනේෂ් මහින්ද මහතා - සාමාජික
    සභාපති,
    රත්නපුර දිස්ත්‍රික් තුරුසවිය ප්‍රාදේශීය සංවිධානය
12. පියසේන මහආරච්චි මහතා - සාමාජික
    සභාපති,
    ගාල්ල දිස්ත්‍රික් තුරුසවිය ප්‍රාදේශීය සංවිධානය

තුරුසවිය අරමුදල විගණන හා කළමනාකරණ කමිටුව - 2022

1. ජී.ඩී.ටී.එස්. පෙරේරා මහතා - සභාපති
   ප්‍රධාන ගණකාධිකාරී,
   වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

2. කේ. ඒ.සී. ශ්‍යාමන්ත මහතා - සාමාජික
   ප්‍රධාන අභ්‍යන්තර විගණක
   වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

3. මාධව වර්ණකුලසූරිය මහතා - සාමාජික
   අධ්‍යක්ෂ ජනරාල්,
   රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව

4. එන්.පී.කුමාරගේ මිය - නිරීක්ෂක
   අධ්‍යක්ෂක,
   මුදල් අමාත්‍යාංශය

5. එස්. කේ. සමරසිංහ මහත්මිය - සාමාජික
   සහකාර විගණකාධිපති ,
   ජාතික විගණන දෙපාර්තමේන්තුව

6. බී.ඒ.එස්.කේ. ප්‍රේමරත්න මහතා - සාමාජික
   සභාපති,
   කෑගල්ල දිස්ත්‍රික් තුරුසවිය ප්‍රාදේශීය සංවිධානය

තුරුසවිය අරමුදල කාර්යමණ්ඩලය - 2022.12.31 දිනට

	තනතුර	නම
01.	සභාපති	විජිත ලොකුනාරංගොඩ මහතා
02.	අධ්‍යක්ෂ	නීතීඥ ආචාර්ය කාංචන සිල්වා මහතා
03.	ගණකාධිකාරී	ජේ.ජී.ජී.වී. බණ්ඩාර මහතා
04.	පරිපාලන නිලධාරී	සමන්මලී මාතරගේ මිය
05.	ප්‍රවර්ධන නිලධාරී	ඩිලාන් තරංග ගුණවර්ධන මහතා
06.	සංවර්ධන නිලධාරී - වැවිලි අමාත්‍යාංශය	එන්.පී.රතුගමගේ මිය
07.	සංවර්ධන නිලධාරී - වැවිලි අමාත්‍යාංශය	යූ.එම්.වේවැල්වල මිය
08.	සංවර්ධන නිලධාරී - වැවිලි අමාත්‍යාංශය	ජේ.එම්. නඳුන් චින්තක ජයසිංහ මහතා
09.	සංවර්ධන නිලධාරී - වැවිලි අමාත්‍යාංශය	ඩී.එම්. ඉන්දික සංජය කුමාර මහතා
10.	සංවර්ධන නිලධාරී - වැවිලි අමාත්‍යාංශය	එස්.යූ. කරුණාරත්න මිය
11.	සංවර්ධන නිලධාරී - වැවිලි අමාත්‍යාංශය	බී.කේ.යූ.ජී.පී. ජයතුංග මහතා
12.	කළමනාකරණ සහකාර (තාක්ෂණ නොවන)	ආර්.දෙහිපිටිය මිය
13.	කළමනාකරණ සහකාර (තාක්ෂණ නොවන)	එල්.ඒ.පී. චන්ද්‍රිකා මිය
14.	කළමනාකරණ සහකාර (තාක්ෂණ නොවන)	අයි.එච්.ඩී.අයි. මධුෂාණි මිය
15.	කළමනාකරණ සහකාර (තාක්ෂණ නොවන)	අයි.කේ. මුණසිංහ මිය
16.	කළමනාකරණ සහකාර (තාක්ෂණ නොවන)	ජී.කේ.එස්. කුමාර මහතා
17.	කළමනාකරණ සහකාර (තාක්ෂණ නොවන)	මල්ෂානි සෙනෙවිරත්න මෙනවිය
18.	කළමනාකරණ සහකාර (තාක්ෂණ නොවන)	එස්.වී.ටී. ප්‍රියංගිකා මිය
19.	කළමනාකරණ සහකාර (තාක්ෂණ නොවන)	එල්.පී. තත්සරණි මෙනවිය
20.	කළමනාකරණ සහකාර (තාක්ෂණ නොවන)	ජී.පී.ජේ.එන්. සේනානායක මිය
21.	කළමනාකරණ සහකාර (තාක්ෂණ නොවන)	ඩී.එම්.එම්.කුමාරිහාමි මෙනවිය
22.	කළමනාකරණ සහකාර (තාක්ෂණ නොවන)	එන්.ඩී. රාජපක්ෂ මිය
23.	කළමනාකරණ සහකාර (තාක්ෂණ නොවන)	කේ.ඒ. චතුරංග මහතා
24.	කළමනාකරණ සහකාර (තාක්ෂණ නොවන)	කේ.ඩබ්.එම්.සී. ප්‍රියදර්ශනී මිය
25.	කළමනාකරණ සහකාර (තාක්ෂණ නොවන)	ආර්.එම්.ඒ. රත්නායක මිය
26.	කළමනාකරණ සහකාර (තාක්ෂණ නොවන)	ඩබ්.ආර්.එස්.ඩබ්. බණ්ඩාර මහතා
27.	කළමනාකරණ සහකාර (තාක්ෂණ නොවන)	ඩබ්.එස්.ජී .ජයවර්ධන මහතා
28.	රියදුරු	යූ. ලාල් ප්‍රියන්ත මහතා
29.	රියදුරු	ශිවන්ත උදයංග මහතා
30.	කාර්යාල කාර්ය සහායක	ප්‍රසන්න සමරතුංග මහතා
31.	කාර්යාල කාර්ය සහායක	ධම්මික විජේසිරි මහතා

ආයතනික කාර්යභාරය, පරමාර්ථ හා උපාය මාර්ග

ආයතනික කාර්යභාරය

ශ්‍රී ලංකාවේ රබර් කර්මාන්තයෙන් උපයනු ලබන විදේශ විනිමයෙන් 68%ක් පමණ වන වැඩි කොටසක් උපයනු ලබන්නේ කුඩා රබර් ඉඩම් හිමියන් විසිනි. එමෙන්ම දේශීය වෙළඳපොළ මෙන්ම ලෝක වෙළඳපොළේ ද ස්වාභාවික රබර් සඳහා ඇති ඉල්ලුම ඉහළ යන ප්‍රවණතාවක් මේ වන විට පවතී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් 2000 අංක 23 දරන තුරුසවිය අරමුදල පනත මඟින් ස්ථාපිත සංස්ථාවක් වන තුරුසවිය අරමුදල මඟින් මෙම කුඩා රබර් ඉඩම් හිමියන්ගේ නිෂ්පාදනවල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම හා වෙළඳපොළ නැංවීම මඟින් ජාතික මට්ටමින් ඔවුන් ශක්තිමත් කිරීම සිදු කරනු ලබයි.

මේ සඳහා කළුතර, කෑගල්ල, කුරුණෑගල, මාතලේ, මහනුවර, රත්නපුර, ගාල්ල, මාතර, හම්බන්තොට, කොළඹ, ගම්පහ, මොණරාගල, බදුල්ල හා අම්පාර යන රබර් වගාව සිදුකරන දිස්ත්‍රික්කවල ගම් මට්ටමින් විසිරී ඇති කුඩා රබර් ඉඩම් හිමියන් ඒකරාශි කර ප්‍රාථමික තුරුසවිය සමිති පිහිටුවා ඇත. එම ප්‍රාථමික තුරුසවිය සමිති නියෝජනය කරමින් කළුතර, කෑගල්ල, රත්නපුර, ගාල්ල හා කොළඹ යන දිස්ත්‍රික්ක සඳහා ප්‍රාදේශීය තුරුසවිය සමිති (දිස්ත්‍රික් සංවිධාන) පහක් පිහිටුවා ඇත. මෙම ප්‍රාදේශීය තුරුසවිය සමිති නියෝජනය කරමින් ශ්‍රී ලංකා කුඩා රබර් වතු සංවර්ධන සමිති සම්මේලනය පිහිටුවා ඇත.

පරමාර්ථ

(අ) කුඩා රබර් වතු හිමියන්ට ඉතිරි කිරීමේ පුරුද්ද ඇති කරවීම සහ ඔවුන්ගේ සමාජ හා ආර්ථික තත්ත්වය ප්‍රවර්ධනය කිරීම

(ආ) රබර් කර්මාන්තය ආශ්‍රිතව වැදගත් වන ආයෝජන ප්‍රවර්ධනය කිරීම

(ඇ) කුඩා රබර් වතුවල ඵලදාව නිෂ්පාදන බවට පත් කිරීමට අවශ්‍ය රබර් පිරිසැකසුම් ඒකක, රබර් කර්මාන්තශාලා සහ වෙනත් පහසුකම් අත්කර ගැනීම, වැඩි දියුණු කර ගැනීම හෝ පිහිටුවීම.

(ඈ) එවැනි රබර් පිරිසැකසුම් ඒකකවල හෝ කර්මාන්තශාලාවල නිෂ්පාදන අලෙවිය ප්‍රවර්ධනය කිරීම සහ වැඩි දියුණු කිරීම.

(ඉ) කුඩා රබර් වතු සංවර්ධන සමිති (තුරුසවිය සමිති) ලියාපදිංචි කිරීම, විධිමත් කිරීම සහ අරමුදල වෙත ලියාපදිංචි වූ එකී සමිතිවල සාමාජිකයන් සඳහා ආධාර ලබා දීම.

(ඊ) කුඩා රබර් වතුවල රබර් නිෂ්පාදන කටයුතුවල යෙදී සිටින තැනැත්තන්ගේ වැඩි දියුණුව හා යහපත සඳහා අවශ්‍ය වන පියවර ගැනීම.

උපායමාර්ගික සංවර්ධන අරමුණු

1. තත්ත්වයෙන් උසස් ගුණාත්මක නිෂ්පාදන ලබා දීම.
2. පරිසර සංරක්ෂණය තුළින් තිරසාර සංවර්ධනයක් ඇති කිරීම.
3. කුඩා රබර් ඉඩම් හිමියන්ගේ නිෂ්පාදන සඳහා ඉහළ මිලක් ලබා දීම.
4. කුඩා රබර් ඉඩම් හිමියන්ගේ සමාජ ආර්ථික තත්ත්වය ඉහළ නැංවීම.

ප්‍රධාන කාර්යාලයෙන් ඉටු කරනු ලබන කාර්යයන්

- 2000 අංක 23 දරන තුරුසවිය අරමුදල පනතට අනුව පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීම.
- බිම් මට්ටමේ විසිරී ඇති කුඩා රබර් වතු හිමියන් ඒකරාශී කර ඔවුන් දැනුවත් කර තුරුසවිය සමිති පිහිටුවීම.
- එසේ පිහිටුවන ලද තුරුසවිය සමිති, තුරුසවිය අරමුදල යටතේ ලියාපදිංචි කිරීම.
- කුඩා රබර් ඉඩම් හිමියන්ගේ අභිවෘද්ධිය වෙනුවෙන් පිහිටුවා ඇති තුරුසවිය සමිතිවල සාමාජිකයින් සඳහා සේවාවන් සැපයීම.
- ගුණාත්මකභාවයෙන් යුතු රබර් ෂීට් නිෂ්පාදනය සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම ලබාදීම.
- මනා කළමනාකාරීත්වයකින් යුතු සමිතියක, සාමාජික හා ආර්ථික වැදගත්කම පිළිබඳව කුඩා රබර් ඉඩම් හිමියන් දැනුවත් කිරීම.
- කුඩා රබර් ඉඩම් හිමියන් සඳහා ණය යෝජනා ක්‍රම හඳුන්වා දීම හා ඒවා ක්‍රියාත්මක කිරීම.
- අමාත්‍යාංශයෙන් හා වෙනත් ආයතනවලින් රබර් වගාව වැඩිදියුණු කිරීම සඳහා ලැබෙන යෝජනා සම්බන්ධයෙන් කඩිනමින් කටයුතු කිරීම හා ඉදිරිපත් කරන ප්‍රශ්න සඳහා කඩිනම් පිළිතුරු ලබා දීම.
- පරිපාලන හා ගිණුම්කරණ කටයුතු සිදු කිරීම.

ප්‍රාදේශීය කාර්යාල මඟින් ඉටු කරනු ලබන කාර්යයන්

දිස්ත්‍රික්ක රාජකාරි කටයුතු සඳහා පත්කර ඇති තුරුසවිය සමිති සම්බන්ධීකරණ නිලධාරීන් ඒ ඒ දිස්ත්‍රික්කවල ප්‍රාදේශීය මට්ටමේ ඇති තුරුසවිය සමිති අධීක්ෂණය සිදු කරනු ලබන අතර ඔවුන්ගෙන් සිදුවන රාජකාරි පහත පරිදි වේ.

- මාසික ඉදිරි වැඩසටහන් /සංශෝධිත වැඩසටහන්, මාසය තුළ ඉටු කරන ලද කාර්යයන් ඇතුළත් වාර්තා ප්‍රධාන කාර්යාලයට ඉදිරිපත් කර එම කාර්යයන් අනුමත කර ගැනීම, සමාලෝචනය හා ඉදිරි වැඩසටහන් සඳහා උපදෙස් ලබා ගැනීමට කටයුතු කිරීම.
- මාස තුනකට වරක් මහා සභා රැස්වීම්වලට සහභාගි වීම.
- තුරුසවිය සමිති අධීක්ෂණ වාර්තා ප්‍රධාන කාර්යාලයට එවීම.
- ගම් මට්ටමින් නව තුරුසවිය සමිති පිහිටුවීම
- අක්‍රීයව පවතින තුරුසවිය සමිති ක්‍රියාකාරී තත්ත්වයට ගෙන ඒමට අවශ්‍ය කටයුතු සැලසීම.
- ගොවි ගැටළු ප්‍රධාන කාර්යාලයට යොමු කර ඒ සඳහා විසඳුම් ලබාගැනීම.
- නිලවරණ පැවැත්වීම.
- ණය යෝජනා ක්‍රම හඳුන්වාදීම හා කුඩා රබර් ඉඩම් හිමියන් ඒ සම්බන්ධයෙන් දැනුවත් කිරීම.
- දිස්ත්‍රික්ක මට්ටමින් හා ප්‍රාදේශීය මට්ටමින් සමූහ සැකසුම් මධ්‍යස්ථාන ඉදිකිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.
- සමූහ සැකසුම් මධ්‍යස්ථාන සඳහා වෙළඳපොළක් බිහි කිරීම.

2022 වසරේ ක්‍රියාකාරී සැලැස්ම ප්‍රකාරව ඉටු කරන ලද කාර්යයන්

1. සමිති ශක්තිමත් කිරීම හා ප්‍රතිසංවිධානය කිරීම

තුරුසවිය අරමුදල රබර් වගාවේ සංවර්ධනය සඳහා කුඩා රබර් වතු හිමියන් වෙත වඩාත් කාර්යක්ෂම සේවාවක් ලබාදීමේ අරමුණින් දිස්ත්‍රික් මට්ටමින් ප්‍රාදේශීය කාර්යාල පිහිටුවා සම්බන්ධීකරණ නිලධාරීන් පත්කර එම නිලධාරීන්ගේ දායකත්වයෙන් ගම් මට්ටමින් තුරුසවිය සමිති ස්ථාපනය කර ඇත. එම තුරුසවිය සමිති හරහා කුඩා රබර් වතු හිමියන්ට තම රබර් කර්මාන්තය ඵලදායීව, කාර්යක්ෂමව හා තෘප්තිමත්ව ඉටු කර ගැනීමට අවශ්‍ය සේවාවන් සැපයීම සිදු කරනු ලබයි.

1.1 2022.12.31 දිනට දීපව්‍යාප්තව පිහිටුවා ඇති තුරුසවිය සමිති හා සාමාජිකයින්

පළාත	දිස්ත්‍රික්කය	දිස්ත්‍රික් වශයෙන්	
		තුරුසවිය සමිති ගණන	තුරුසවිය සමිති සාමාජිකයින් ගණන
බස්නාහිර	1. කොළඹ	21	580
	2. ගම්පහ	19	502
	3. කළුතර	202	6,766
සබරගමුව	4. රත්නපුර	106	3,429
	5. කෑගල්ල	214	6,350
දකුණ	6. ගාල්ල	47	1,107
	7. මාතර	22	624
	8. හම්බන්තොට	05	138
මධ්‍යම	9. නුවර	14	372
	10. මාතලේ	01	32
වයඹ	11. කුරුණෑගල	11	287
ඌව	12. මොණරාගල	150	4,587
	13. බදුල්ල	06	164
නැගෙනහිර	14. අම්පාර	55	1,191
එකතුව		**873**	**26,129**

1.2 සමිති ශක්තිමත් කිරීම/ නව සමිති පිහිටුවීම

භෞතික ප්‍රගතිය

- 2022 වර්ෂයේ පවත්වන ලද තුරුසවිය සමිති රැස්වීම් ගණන 980 කි.
- 2022 වර්ෂයේ අළුතින් පිහිටුවන ලද තුරුසවිය සමිති ගණන 35 කි.

2. තුරුසවිය අරමුදලේ පරමාර්ථ සාක්ෂාත් කරගනුවස් උපායමාර්ගික සංවර්ධන අරමුණු ඔස්සේ පෙළගස්වන ලද වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය

පරමාර්ථ	උපායමාර්ග	සැලසුම් කරන ලද වැඩසටහන්	ප්‍රගතිය 2022
(අ) කුඩා රබර් වතු හිමියන්ට ඉතිරි කිරීමේ පුරුද්ද ඇති කර වීම සහ ඔවුන්ගේ සමාජ හා ආර්ථික තත්ත්වය ප්‍රවර්ධනය කිරීම	තත්ත්වයෙන් උසස් ගුණාත්මක නිෂ්පාදන ලබා දීම.	1. රබර් වගාව, කිරි කැපීම, ලෙඩ රෝග හා විද්‍යානුකූලව පොහොර යෙදීම පිළිබඳ පුහුණු වැඩසටහන	වැඩසහන් 10 ප්‍රතිලාභීන් 344
		2. ආර්.එස්.එස්. නො.01 රබර් ෂීට් නිෂ්පාදනය පිළිබඳ පුහුණු වැඩසටහන	වැඩසටහන් 12 ප්‍රතිලාභීන් 460
		3. එක් දින දුම් ගෙවල් සැකසීම සම්බන්ධ පුහුණු වැඩසටහන	-
		4. රබර් වගාව ආශ්‍රිත වැහි ආවරණ යෙදීම පිළිබඳ පුහුණු වැඩසටහන	-
		5. නවක රබර් කිරි අස්වනු සහායක ශිල්පීන් පුහුණු කිරීමේ වැඩසටහන	වැඩසටහන් 04 ප්‍රතිලාභීන් 200
(ආ) රබර් කර්මාන්තය ආශ්‍රිතව වැදගත් වන ආයෝජන ප්‍රවර්ධනය කිරීම	පරිසර සංරක්ෂණය තුළින් තිරසාර සංවර්ධනයක් ඇති කිරීම.	6. රබර් වගාව සඳහා කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය පිළිබඳ පුහුණු වැඩසටහන	වැඩසටහන් 03 ප්‍රතිලාභීන් 121
(ඇ) කුඩා රබර් වතුවල එලදාව නිෂ්පාදන බවට පත් කිරීම සඳහා අවශ්‍ය රබර් පිරිසැකසුම් ඒකක, රබර් කර්මාන්තශාලා සහ වෙනත් පහසුකම් අත්කර ගැනීම, වැඩි දියුණු කර ගැනීම හෝ පිහිටුවීම. (ඈ) එවැනි රබර් පිරිසැකසුම් ඒකකවල හෝ කර්මාන්තශාලාවල නිෂ්පාදන අලෙවිය ප්‍රවර්ධනය කිරීම සහ වැඩි දියුණු කිරීම.	තත්ත්වයෙන් උසස් ගුණාත්මක නිෂ්පාදන ලබා දීම. කුඩා රබර් ඉඩම් හිමියන්ගේ නිෂ්පාදන සඳහා ඉහළ මිලක් ලබා දීම.	7. සමූහ සැකසුම් මධ්‍යස්ථාන සංවර්ධනය/ පිහිටුවීම 8. ඵලදායිතාවයෙන් හා ඉහළ කාර්යක්ෂමතාවයකින් යුක්ත නව තාක්ෂණික එක් දින වියළුම් කුටීර ඉදිකිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම හා මූල්‍ය ආධාර ලබාදීම	- නවීන තාක්ෂණයෙන් යුත් එක් දින වියළුම් කුටීර 12
(ඉ) කුඩා රබර් වතු සංවර්ධන සමිති (තුරුසවිය සමිති) ලියාපදිංචි කිරීම, විධිමත් කිරීම සහ අරමුදල වෙත ලියාපදිංචි වූ එකී සමිතිවල සාමාජිකයන් සඳහා ආධාර ලබා දීම.	කුඩා රබර් ඉඩම් හිමියන්ගේ සමාජ ආර්ථික තත්ත්වය ඉහළ නැංවීම.	9. තුරුසවිය සමිති ශක්තිමත් කිරීම හා නව සමිති පිහිටුවීම සඳහා සමිති රැස්වීම් පැවැත්වීම 10. සමිති සාමාජිකයින්ට රබර් කර්මාන්තය සඳහා අවශ්‍ය උපකරණ ලබාදීම	සමිති රැස්වීම් 980 නව සමිති 35 කිරි පිහි 1,747
(ඊ) කුඩා රබර් වතුවල රබර් නිෂ්පාදන කටයුතුවල යෙදී සිටින තැනැත්තන්ගේ සංවර්ධනය හා යහපත සඳහා අවශ්‍ය පියවර ගැනීම.	කුඩා රබර් ඉඩම් හිමියන්ගේ සමාජ ආර්ථික තත්ත්වය ඉහළ නැංවීම.	11. මී මැසි පාලනය පිළිබඳ පුහුණු වැඩසටහන	-

2.1 තුරුසවිය සමිති සාමාජිකයින් වෙනුවෙන් පවත්වන ලද පුහුණු වැඩසටහන් - 2022

අනු අංකය	දිස්ත්‍රික්කය හා කොට්ඨාසය	දිනය (2022)	ස්ථානය	පුහුණු වැඩසටහන	ප්‍රතිලාභී සංඛ්‍යාව
01	කළුතර (පාලින්දනුවර)	01/03	බටහේන තුරුසවිය සමිතියේ සභාපති ජෝසප් මහතාගේ නිවස	රබර් වගාව සඳහා කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය පිළිබඳ පුහුණු වැඩසටහන	**45**
02	කළුතර (පාලින්දනුවර)	07/25	ගලහිටිය ශ්‍රී මහමෙව්නා විහාරය	රබර් වගාව, කිරි කැපීම හා විද්‍යානුකූලව පොහොර යෙදීම පිළිබඳ පුහුණු වැඩසටහන	**38**
03	කළුතර (මතුගම)	12/02	සේවා පියස පුස්සැල්ල	ආර්.එස්.එස්.නො.01 රබර් ෂීට් නිෂ්පාදනය හා වැහි ආවරණ යෙදීම පිළිබඳ පුහුණු වැඩසටහන	**40**
04	රත්නපුර (නිවිතිගල)	03/16	මාවත්ත එකමුතු තුරුසවිය සමිතියේ රත්නායක මහතාගේ නිවස	රබර් වගාව සඳහා කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය පිළිබඳ පුහුණු වැඩසටහන	**38**
05	රත්නපුර (ඇහැළියගොඩ)	04/01	හේවායින්න ප්‍රජාශාලාව	රබර් වගාව, කිරි කැපීම හා විද්‍යානුකූලව පොහොර යෙදීම හා ආර්.එස්.එස්.නො.01 රබර් ෂීට් නිෂ්පාදනය පිළිබඳ පුහුණු වැඩසටහන	**31**
06	රත්නපුර (කිරි ඇල්ල)	8/16	මාටුවාගල විහාරස්ථානය	රබර් වගාව, කිරි කැපීම හා විද්‍යානුකූලව පොහොර යෙදීම පිළිබඳ පුහුණු වැඩසටහන	**41**
07	රත්නපුර (ගොඩකවෙල)	10/07	මාකදුර ප්‍රජාශාලාව	ආර්.එස්.එස්.නො.01 රබර් ෂීට් නිෂ්පාදනය පිළිබඳ පුහුණු වැඩසටහන	**28**
08	රත්නපුර (ඇහැළියගොඩ)	10/21	කිරි පෝරුව විහාරය	ආර්.එස්.එස්.නො.01 රබර් ෂීට් නිෂ්පාදනය හා වැහි ආවරණ යෙදීම පිළිබඳ පුහුණු වැඩසටහන	**35**
09	රත්නපුර (ඇහැළියගොඩ)	11/28	ඇලපාත සිරිවර්ධනාරාමය	ආර්.එස්.එස්.නො.01 රබර් ෂීට් නිෂ්පාදනය හා වැහි ආවරණ යෙදීම පිළිබඳ පුහුණු වැඩසටහන	**48**
10	ගාල්ල (ඇල්පිටිය)	03/29	ඕමත්ත තුරුසවිය සමිතියේ ලේකම් දේවිකා මියගේ නිවස	ආර්.එස්.එස්.නො.01 රබර් ෂීට් නිෂ්පාදනය පිළිබඳ පුහුණු වැඩසටහන	**17**
11	ගාල්ල (බද්දේගම)	8/12	තලාව ශක්ති තුරුසවිය සමිතියේ සභාපති ජිනසෝම මහතාගේ නිවස	ආර්.එස්.එස්.නො.01 රබර් ෂීට් නිෂ්පාදනය පිළිබඳ පුහුණු වැඩසටහන	**18**
12	හම්බන්තොට (කටුවන)	04/06	කටුවන තුරුසවිය සමිතියේ සාමාජික ඩී.ජේ. ගුණසේකර මහතාගේ නිවස	ආර්.එස්.එස්.නො.01 රබර් ෂීට් නිෂ්පාදනය පිළිබඳ පුහුණු වැඩසටහන	**31**
13	මාතර (විල්පිට)	07/15	විල්පිට තුරුසවිය සමිතියේ සභාපති කේ.ජී. රංජිත් මහතාගේ නිවස	රබර් වගාව, කිරි කැපීම හා විද්‍යානුකූලව පොහොර යෙදීම පිළිබඳ පුහුණු වැඩසටහන	**18**
14	කුරුණෑගල (මාවතගම)	2/23	ඉඟුරුවත්ත තුරුසවිය සමිතියේ වසන්ත මහතාගේ දුම් කාමරය ආශ්‍රිතව	ආර්.එස්.එස්.නො.01 රබර් ෂීට් නිෂ්පාදනය පිළිබඳ පුහුණු වැඩසටහන	**53**

අනු අංකය	දිස්ත්‍රික්කය හා කොට්ඨාසය	දිනය (2022)	ස්ථානය	පුහුණු වැඩසටහන	ප්‍රතිලාභී සංඛ්‍යාව
15	කුරුණෑගල (පොල්ගහවෙල)	3/16	මාවත්ත එකමුතු තුරුසවිය සමිතියේ රත්නායක මහතාගේ නිවස	රබර් වගාව සඳහා කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය පිළිබඳ පුහුණු වැඩසටහන	**38**
16	කෑගල්ල (දැරණියගල)	2/28	කිරිහේන විහාරස්ථානය	රබර් වගාව, කිරි කැපීම හා විද්‍යානුකූලව පොහොර යෙදීම පිළිබඳ පුහුණු වැඩසටහන	**30**
17	කෑගල්ල (කෑගල්ල)	4/8	වතුර තුරුසවිය සමිතියේ ඊ.පී. පියදාස මහතාගේ දුම් ගෙය ආශ්‍රිතව	ආර්.එස්.එස්.නො.01 රබර් ෂීට් නිෂ්පාදනය පිළිබඳ පුහුණු වැඩසටහන	**61**
18	කෑගල්ල (රඹුක්කන)	4/8	දුනුකේවල විහාරස්ථානය	ආර්.එස්.එස්.නො.01 රබර් ෂීට් නිෂ්පාදනය පිළිබඳ පුහුණු වැඩසටහන	**33**
19	කෑගල්ල (පොල්ගහවෙල)	7/19	පොල්ගහවෙල කහවත්ත ඇල නිශ්ශංක මහතාගේ නිවස	රබර් වගාව, කිරි කැපීම හා විද්‍යානුකූලව පොහොර යෙදීම පිළිබඳ පුහුණු වැඩසටහන	**45**
20	කෑගල්ල (කෑගල්ල)	7/20	බුළුගහදෙණිය අතුල මහතාගේ නිවස	ආර්.එස්.එස්.නො.01 රබර් ෂීට් නිෂ්පාදනය පිළිබඳ පුහුණු වැඩසටහන	**46**
21	කෑගල්ල (මාවනැල්ල)	12/20	වාඩුවාවල හේමමාලී මහත්මියගේ දුම් කාමරය ආශ්‍රිතව	ආර්.එස්.එස්.නො.01 රබර් ෂීට් නිෂ්පාදනය හා වැහි ආවරණ යෙදීම පිළිබඳ පුහුණු වැඩසටහන	**50**
22	මොණරාගල (මැදගම)	3/29	කීනගොඩ ප්‍රජාශාලාව	රබර් වගාව, කිරි කැපීම හා විද්‍යානුකූලව පොහොර යෙදීම පිළිබඳ පුහුණු වැඩසටහන	**36**
23	මොණරාගල (බිබිල)	9/2	ඉලුකාපන ප්‍රජාශාලාව	රබර් වගාව, කිරි කැපීම හා විද්‍යානුකූලව පොහොර යෙදීම පිළිබඳ පුහුණු වැඩසටහන	**26**
24	මොණරාගල (බඩල්කුඹුර)	9/14	ඇත්තලාමුල්ල තුරුසවිය සමිතියේ සාමාජික ප්‍රසන්න මහතාගේ නිවස	රබර් වගාව, කිරි කැපීම හා විද්‍යානුකූලව පොහොර යෙදීම පිළිබඳ පුහුණු වැඩසටහන	**51**
25	මොණරාගල (බඩල්කුඹුර)	18/10	5 කණුව ප්‍රජා ශාලාව	රබර් වගාව, කිරි කැපීම හා විද්‍යානුකූලව පොහොර යෙදීම පිළිබඳ පුහුණු වැඩසටහන	**28**

පුහුණු වැඩසටහන් පැවැත්වීමේ ප්‍රගතිය 2022

ඉලක්කය - වැඩසටහන් 30
පැවැත් වූ වැඩසටහන් ගණන - 25
ප්‍රතිලාභීන් ගණන - 925
භෞතික ප්‍රගතිය - 83%

මූල්‍ය ප්‍රගතිය 2022.12.31 දිනට

ඉලක්කය - රු.මි. 0.60
2022.12.31 දිනට වියදම - රු.මි. 0.544
මූල්‍ය ප්‍රගතිය - 91%

2.2 රබර් නිෂ්පාදන ක්‍රියාවලියට අවශ්‍ය උපකරණ කුඩා රබර් වතු හිමියන්ට නොමිලේ / සහනදායී පදනම මත ලබාදීම

තුරුසවිය අරමුදල විසින් කුඩා රබර් වතු හිමියන්ට රබර් නිෂ්පාදනය සඳහා අවශ්‍ය දියරෝල්, ඩයමන්ඩ් රෝල්, කිරි මුදවන තැටි හා කිරිපිහි 50% සහනදායී මිලකට ලබාදෙන අතර කිරි එකතුකරන ප්ලාස්ටික් කෝප්ප හා එම කෝප්ප රඳවන කම්බි නොමිලේ ලබාදෙනු ලැබේ.

2.2.1. 2022 වර්ෂයේ නොමිලේ/සහනදායී පදනම මත උපකරණ සැපයීමේ භෞතික ප්‍රගතිය

උපකරණ වර්ගය	මිල දී ගත් උපකරණ ගණන	ඒකක වටිනාකම රු.	2022.12.31 දිනට බෙදා දුන් කිරිපිහි ගණන (50% සහනදායී පදනම මත)	ප්‍රතිලාභීන් ගණන
1. කිරි පිහිය	4,000	845.00	1,747	1,747

කිරි පිහි බෙදාදීම - 2022

අනු අංකය	දිස්ත්‍රික්කය	%50 සහනදායී පදනම මත බෙදා දුන් කිරි පිහි ගණන
1.	රත්නපුර	356
2.	කෑගල්ල / මාතලේ/ මහනුවර / කුරුණෑගල	377
3.	මොණරාගල	255
4.	බදුල්ල / අම්පාර	356
5.	කොළඹ / ගම්පහ	50
6.	කළුතර	97
7.	ගාල්ල /මාතර / හම්බන්තොට	146
8.	රත්නපුර රබර් පර්යේෂණ ආයතනය	110
	එකතුව	**1,747**

3. 2022 වර්ෂයේ ක්‍රියාත්මක විශේෂ ව්‍යාපෘති

3.1 නවක කිරි අස්වනු ශිල්පීන් පුහුණු කිරීමේ වැඩසටහන 2022

ප්‍රමුඛතා ක්ෂේත්‍රය - කුඩා හා මධ්‍ය පරිමාණ රබර් වතු හිමියන්ගේ සංවර්ධනය සඳහා දිරිගැන්වීමක් ලබාදෙමින් රබර් කර්මාන්තයට අවශ්‍ය අමුද්‍රව්‍ය ලබා ගැනීම සහතික කිරීම.

ශ්‍රී ලංකා රබර් කර්මාන්ත ප්‍රධාන සැලැස්ම (Sri Lanka Rubber Industry Master Plan) 2017 – 2026 මඟින් සැලසුම් කර ඇති ප්‍රධාන ව්‍යාපෘති 25 අතුරින් 09 වන ව්‍යාපෘතිය වන රබර් කිරි කපන්නන් දිරිමත් කිරීම යන ව්‍යාපෘතිය හා සෘජුවම අනුගත වෙමින්, ඒ අනුව රබර් නිෂ්පාදන කටයුතු පවත්වා ගැනීම සඳහා දක්ෂ හා අභිප්‍රේරිත රබර් කිරි කපන්නන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් ආකර්ෂණය කර තබා ගැනීම ප්‍රමුඛ කර ගෙන මෙම වැඩසටහන ක්‍රියාත්මක කරයි.

විශේෂ අරමුණු -

1. කිරි අස්වනු ශිල්පීන්ගේ ඵලදායිතාව සහ ඔවුන්ගේ ආදායම් මට්ටම ඉහළ නැංවීම
2. නව පිවිසුම් ආකර්ශනය කර ගැනීම සහ කිරි අස්වනු ශිල්පීන්ගේ නිහයට පිළියමක් ලෙස නිවැරදි ලෙස රබර් කිරි කැපීමේ කුසලතා වර්ධනය කිරීම
3. දක්ෂ රබර් කිරි කැපුම් කරුවන්ට රැකියා සොයා ගැනීමට සහාය වීම

ක්‍රියාකාරකම් -

රබර් පර්යේෂණ ආයතනය විසින් සකසන ලද සම්මත පුහුණු වැඩසටහනකි.

i. පුහුණු වැඩසටහනේ අන්තර්ගතය
   - රබර් වගාව
   - රබර් කිරි කැපීම
   - විද්‍යාත්මක පොහොර යෙදීම
   - වැසි ආවරණ යෙදීම
   - ගුණාත්මක රබර් ෂීට් නිෂ්පාදන ක්‍රියාවලිය

ii. පුහුණුකරුවන් හඳුනා ගැනීම - තුරුසවිය සමිති සාමාජිකයින්ගෙන්

iii. පුහුණු කාලය - පූර්ණ කාලීන පදනම මත අවම වශයෙන් දින 7

iv. පුහුණුව අවසන් වූ පසු ලිඛිත පරීක්ෂණයක් සහ ප්‍රායෝගික පරීක්ෂණයක් මඟින් ඇගයීම සිදු කෙරේ.

v. සියලුම සාර්ථක අභ්‍යාසලාභීන්ට ලැබෙන ප්‍රතිලාභ
   - තුරුසවිය අරමුදල මඟින් සහතිකයක් පිරිනැමීම
   - ක්ෂේත්‍රයේ භාවිතයට අවශ්‍ය කිරි පිහියක් ලබා දීම
   - දිරි දීමනාවක් ලබාදීම

vi. අපේක්ෂිත ප්‍රතිඵලය -
   - කුඩා රබර් වතු හිමියන්ගේ ජීවන තත්ත්වය ස්ථාවර වීම
   - රබර් වගාවන්හි ඵලදායිතාව වැඩි දියුණු වීම
   - ගම්වාසීන්ට ආදායම් උත්පාදන අවස්ථා ලැබීම
   - රබර් කිරි කැපීම් වෘත්තිය හැරයාම අඩුවීම

3.1.1. වෘත්තීය රබර් කිරි අස්වනු සහායක ශිල්පීන් පුහුණු කිරීමේ වැඩසටහන 2022 - ප්‍රගතිය

භෞතික ප්‍රගතිය 2022.12.31 දිනට

වැඩසටහන් අංකය	දිස්ත්‍රික්කය	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	පුහුණුලාභීන් ගණන	ස්ත්‍රී /පුරුෂභාවය	
				ස්ත්‍රී	පුරුෂ
01	රත්නපුර	රත්නපුර	50	38	12
02	කෑගල්ල	දැරණියගල	50	18	32
03	හම්බන්තොට	මිද්දෙණිය	50	30	20
04	මොණරාගල	මොණරාගල	50	30	20
	එකතුව		**200**	**116**	**84**

ඉලක්කය - පුහුණු වැඩසටහන් 05
අවසන් කරන ලද වැඩසටහන් ගණන - 04
භෞතික ප්‍රගතිය - 80%

මූල්‍ය ප්‍රගතිය 2022.12.31 දිනට
ඉලක්කය - රු.මි. 4.25
2022.12.31 දිනට වියදම - රු.මි. 3.864
මූල්‍ය ප්‍රගතිය - 91%

3.2 ඵලදායිතාවයෙන් හා ඉහළ කාර්යක්ෂමතාවයකින් යුක්ත නවීන දුම් කුටීර ඉදිකිරීම

ප්‍රමුඛතා ක්ෂේත්‍රය - කුඩා හා මධ්‍ය පරිමාණ රබර් වතු හිමියන්ගේ දියුණුව සඳහා දිරිගැන්වීමක් ලබාදෙමින් රබර් කර්මාන්තයට අවශ්‍ය අමුද්‍රව්‍ය ලබා ගැනීම සහතික කිරීම.

අරමුණු -

1. කුඩා රබර් වතු හිමියන්ගේ ජීවනෝපාය සංවර්ධනය සහ ඵලදායිතාව ඉහළ නැංවීම සහ ඒ මඟින් ආදායම් මට්ටම ඉහළ නැංවීම
2. දුම් ගැසූ රබර් ෂීට් නිෂ්පාදන පිරිවැය අවම කිරීම සඳහා නවීන (නව තාක්ෂණික) එක් දින වියළුම් දුම් කුටි හඳුන්වාදීම
3. කුඩා රබර් වතු හිමියන් අතර තරඟකාරීත්වය වැඩිදියුණු කිරීම සහ වඩාත් ගුණාත්මක නිෂ්පාදන නිෂ්පාදනය කිරීම

ක්‍රියාකාරකම් -

1. ප්‍රවෘත්ති පත්‍රවල ප්‍රචාරණය මඟින් සහ දිස්ත්‍රික් මට්ටමින් ක්ෂේත්‍ර නිලධාරීන් සම්බන්ධීකරණය මඟින් දිවයින පුරා විසිරී සිටින තුරුසවිය සමිති සාමාජිකයින් වෙනුවෙන් ඉහළ ඵලදායිතාවයෙන් හා කාර්යක්ෂමතාවයකින් යුක්ත නවීන තාක්ෂණික එක් දින වියළුම් කුටීර ඉදිකිරීමේ ව්‍යාපෘතිය පිළිබඳව දැනුවත් කිරීම
2. දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරීන් මඟින් දිවයින පුරා සිටින තුරුසවිය නිලධාරීන් දැනුවත් කිරීම
3. තෝරා ගත් සමිති සඳහා තුරුසවිය කළමනාකරණ මණ්ඩලයෙන් අනුමැතිය ලබා ගැනීම
4. කළමනාකරණ මණ්ඩලය විසින් අනුමත කරන ලද තෝරාගත් තුරුසවිය සමිති වෙත ඇස්තමේන්තු සහ සැලසුම් බෙදා හැරීම
5. එක් දුම් ගෙයක් ඉදිකිරීම සඳහා රුපියල් 150,000.00 බැගින් ආධාර මුදලක් ලබාදීම.
6. ස්ථාන පරීක්ෂාව (තාක්ෂණික සහය ලබා දීම, සැලසුම් සකස් කිරීම, ඇස්තමේන්තු කිරීම සහ නවීන තාක්ෂණික එක් දින වියළුම් කුටීරයේ පිරිවැය ඇස්තමේන්තු කිරීම.)

ප්‍රතිපාදන - 2022 - රු.මි. 3.00

අපේක්ෂිත ඉලක්කය	- දුම් ගෙවල් 20
එක් දුම් ගෙයක් සඳහා ලබා දෙන ආධාර මුදල	- රු.150,000.00
කාල සීමාව	- 2022.06.30 – 2022.12.31

අපේක්ෂිත ප්‍රතිඵලය -

- ❖ උසස් තත්ත්වයේ නිෂ්පාදන ප්‍රමාණය වැඩි වීම
- ❖ නිෂ්පාදන පිරිවැය අඩු වීම
- ❖ නව තාක්ෂණය පිළිබඳ දැනුවත් වීම සහ දැනුම හුවමාරු කර ගැනීමට අවස්ථාව ලැබීම

නවීන තාක්ෂණික දුම් කාමර ඉදි කිරීමේ භෞතික හා මූල්‍ය ප්‍රගතිය - 2022

භෞතික ප්‍රගතිය 2022.12.31 දිනට

	දිස්ත්‍රික්කය	තුරුසවිය සමිතිය	දුම් කාමර ගණන
01	කුරුණෑගල	වෑ උඩ තුරුසවිය සමිතිය	01
02	කුරුණෑගල	ඉඟුරු වත්ත	01
03	කෑගල්ල	ගබ්බෙල ශක්ති	01
04	කෑගල්ල	වෙලන්ගල්ල	01
05	කෑගල්ල	අළුදෙණිය සමගි -	01
06	මොණරාගල	කණ්ඩිත්වත්ත	01
07	මොණරාගල	ඇලවත්ත	02
08	මොණරාගල	කරවිල පුබුදු	01
09	මොණරාගල	පුබ්බාර	02
10	මොණරාගල	රදලියැද්ද විමුක්ති	01
	එකතුව		**12**

ඉලක්කය - නවීන දුම් කාමර 20

ඉදිකිරීම් නිම කරන ලද දුම් කාමර ගණන - 12

භෞතික ප්‍රගතිය **- 60%**

මූල්‍ය ප්‍රගතිය 2022.12.31 දිනට

ඉලක්කය - රු.මි. 3.00

2022.12.31 දිනට වියදම - රු.මි. 0.779 *

මූල්‍ය ප්‍රගතිය **- 26%**

* අනුමත වූ ප්‍රතිපාදන නොලැබීම නිසා 2022 වර්ෂයේදී ගෙවීම් සිදු කිරීමට හැකි වූයේ නවීන දුම් කාමර 05 කට පමණි.

4. තුරුසවිය අරමුදල - ක්‍රියාකාරී සැලැස්ම ප්‍රකාරව ප්‍රගති සමාලෝචනය - 2022

4.1 ප්‍රතිපාදන වෙන්වීම 2022

	මූල්‍යනය	අනුමත ප්‍රතිපාදන 2022 රු.මි.	2022.12.31 දිනට ලැබුණු ප්‍රතිපාදන රු.මි.	2022.12.31 දිනට වියදම රු.මි.	මූල්‍ය ප්‍රගතිය (ලද ප්‍රතිපාදනවලට අනුව) %
ප්‍රාග්ධන	දේශීය අරමුදල්	18.00	**8.32**	**8.40**	**100%**
පුනරාවර්තන	දේශීය අරමුදල්	29.00	**27.725**	**27.89**	**100%**
එකතුව		**47.00**	**36.045**	**36.29**	**100%**

4.2 සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම - 2022

වැඩසටහන/ව්‍යාපෘතිය	ඇස්තමේන්තුව රු.මි.	සත්‍ය වියදම 2022 12.31.ට රු.මි.	මූල්‍ය ප්‍රගතිය %	භෞතික ඉලක්ක	භෞතික ප්‍රගතිය %
1. තුරුසවිය සමිති සඳහා සම්පත් බෙදා දීම					
1.1 කිරි පිහි (50% සහනදායී ක්‍රමය යටතේ බෙදාදීම)	2.80	**1.690**	**60%**	කිරි පිහි 3,000 ක් බෙදා දීම	**44%** කිරි පිහි 4000 ක් මිල දී ගෙන ඇත. 2022.12.31 දිනට කිරි පිහි 1747 ක් බෙදා දී ඇත.
1.2 රබර් කිරි එකතු කරන කෝප්ප හා කම්බි	5.65	**0.110**	**2%**	135,000	ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 අනුව ප්‍රසම්පාදන කටයුතු අත්හිටුවා ඇත.
2. සමිති පිහිටුවීම සහ ශක්තිමත් කිරීම සමිති ශක්තිමත් කිරීම/ නව සමිති පිහිටුවීම සඳහා සමිති රැස්වීම් පැවැත්වීම	1.60	**1.314**	**82%**	සමිති ශක්තිමත් කිරීම් 835	**100%** පවත්වන ලද සමිති රැස්වීම් ගණන - 980 පිහිටුවන ලද නව සමිති ගණන - 35
3. දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන්	0.60	**0.544**	**91%**	පුහුණු වැඩසටහන් 30	**83%** පුහුණු වැඩසටහන් -25
4. විශේෂ ව්‍යාපෘති - රබර් කිරි අස්වනු සහායක ශිල්පීන් පුහුණු කිරීමේ ව්‍යාපෘතිය	4.25	**3.864**	**91%**	පුහුණු වැඩසටහන් 05	**80%** පුහුණු වැඩසටහන් -04 ප්‍රතිලාභීන් - 200
5. නව තාක්ෂණයෙන් යුතු දුම් කාමර ඉදි කිරීම	3.00	**0.779**	**26%**	නවීන දුම් කාමර 20	**60%** දුම් කාමර - 12 ගෙවීම් සිදුකර ඇති - 05 ගෙවීම් සිදු කිරීමට ඇති -07
6. කාර්ය මණ්ඩල පුහුණුව	0.10	**0.097**	**97%**	පුහුණු වැඩසටහන් 02	**100%** පුහුණු වැඩසටහන් - 02 ප්‍රතිලාභීන් - 02
සමස්ථ ප්‍රගතිය	**18.00**	**8.398**	**47% ****		**78%**

**** 2022 සඳහා අනුමත වූ ප්‍රතිපාදන අනුව ඇස්තමේන්තු කල ද එම ප්‍රතිපාදන නොලැබීම නිසා අපේක්ෂිත මූල්‍ය ප්‍රගතිය වාර්තා කිරීමට නොහැකි විය.**

තුරුසවිය අරමුදල

අවසන් ගිණුම් වාර්තාව - 2022

තුරුසවිය අරමුදල

2022.12.31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශන

	සටහන	2022 (රු.) අගය	2021 (රු.) අගය
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපළ පිරියත හා උපකරණ	**1**	16,509,365.55	21,071,498.36
		16,509,365.55	**21,071,498.36**
ජංගම වත්කම්			
මුදල් හා මුදල්වලට සමාන දෑ	**2**	22,340,522.02	21,865,251.09
වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු මුදල්	**3**	3,431,601.68	2,253,757.11
තොගය	**උපලේඛනය-1**	2,309,916.12	1,116,879.51
උපචිත ආදායම්	**4**	-	1,155,874.20
		28,082,039.82	**26,391,761.91**
මුළු වත්කම්		**44,591,405.37**	**47,463,260.26**
වගකීම්			
උපචිත වියදම්	**5**	477,874.08	205,436.52
කිරි පිහි සඳහා ගෙවිය යුතු		1,007,662.50	-
විගණන ගාස්තු සඳහා වෙන් කිරීම්		500,000.00	400,000.00
තවමත් බෙදා නැති කිරි පිහි		-	377,715.00
		1,985,536.58	**983,151.52**
ජංගම නොවන වගකීම්			
පාරිතෝෂික දීමනා සඳහා වෙන් කිරීම්	**උපලේඛනය - 2**	7,035,288.23	6,428,342.58
මුළු වගකීම්		**9,020,824.81**	**7,411,494.10**
මුළු ශුද්ධ වත්කම්		**35,570,580.55**	**40,051,766.16**
ශුද්ධ වත්කම්			
ශුද්ධ වත්කම්/හිමිකම්			
රජය සහ අනෙකුත් ආයතන විසින් වන ප්‍රාග්ධන දායකත්වය		50,200,000.00	50,200,000.00
තුරුසවිය අරමුදලේ සමුච්චිත. අතිරික්තයන්/(හිඟ)		(16,395,486.53)	(11,406,251.84)
සමිති සාමාජික අරමුදල		1,258,018.00	1,258,018.00
වෙනත් ප්‍රදාන සහ සංචිත		508,049.08	
ශුද්ධ වත්කම්/හිමිකම්		**35,570,580.55**	**40,051,766.16**

ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන කට්ටලය සකස් කර ඇත.(SLPSAS)

ගණකාධිකාරී	අධ්‍යක්ෂ	සභාපති
ජේ.ජී.ජී.වී. බණ්ඩාර	**ආචාර්ය එස්.ඩබ්ලිව්.ආර්.කේ. සිල්වා**	**වී. ලොකුනාරංගොඩ**

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශනයේ (පිටු අංක 22 සිට 26 දක්වා) ඇති අත්‍යවශ්‍ය කොටසකි. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩල පූර්ණ වගකීමකට බැඳේ. අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් කරන ලද අධ්‍යක්ෂවරුන් මෙම මූල්‍ය ප්‍රකාශන අනුමත කර ඇත.

අධ්‍යක්ෂ	අධ්‍යක්ෂ
ජී.ඩී.ටී.එස්. පෙරේරා	**ජී.කේ.ආර්. ප්‍රියංකර**
(ප්‍රධාන ගණකාධිකාරී - වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය)	**(අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික - තුරුසවිය අරමුදල)**

තුරුසවිය අරමුදල

2022 දෙසැම්බර් 31න් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	2022 (රු.)	2021 (රු.)
ආදායම්			
භාණ්ඩාගාර ප්‍රදාන	**6**	36,045,000.00	49,290,166.46
දුම් ගෙවල් ව්‍යාපෘතියේ ප්‍රදාන		-	21,000,000.00
වෙනත් ආදායම්	**7**	1,630,653.68	586,709.13
මුළු ආදායම්		**37,675,653.68**	**70,876,875.59**
මෙහෙයුම් වියදම්			
වැටුප්, වේතන හා සේවක ප්‍රතිලාභ	**8**	19,417,548.98	14,474,342.02
ගමන් වියදම්	**9**	109,185.15	263,503.40
සැපයුම් හා පාරිභෝගික වියදම්	**10**	9,365,387.43	9,747,046.57
ක්ෂය වියදම්		5,110,181.89	4,929,043.53
සංවර්ධන වියදම්	**11**	2,794,022.79	14,607,621.37
කිරි කැපුම් පුහුණු ව්‍යාපෘතියේ වියදම්		3,880,819.91	2,315,784.32
දුම් ගෙවල් ව්‍යාපෘතියේ සහනාධාර		779,459.00	20,756,299.21
අනෙකුත් වියදම්	**12**	197,868.59	240,172.48
මුළු වියදම්		**41,654,473.74**	**67,333,812.90**
කාල පරිච්ඡේදය සඳහා අතිරික්තය / ඌනතාවය		**(3,978,820.06)**	**3,543,062.69**

තුරුසවිය අරමුදල						
2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය						
හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශය						**මුළු ශුද්ධ වත්කම්/ හිමිකම්**
	ප්‍රාග්ධන දායකත්වය/ අරමුදල රු.	**වෙනත් ප්‍රදාන හා සංචිත**	**සාමාජික මුදල් හා පරිපාලන ගාස්තු රු.**	**ප්‍රත්‍යාගණන සංචිත**	**සමුච්චිත ක්ෂය අතිරික්තය/ ඌනතාවය**	
2019.01.01 දිනට ශේෂය	**27,000,000.00**	**-**	**1,263,418.00**	**-**	**(19,474,854.20)**	**8,788,563.80**
සාමාජික මුදල් ශුද්ධ ආදායම 2020	-	-	4,600.00	-	-	4,600.00
2020 වසරේ අතිරික්තය/ ඌනතාවය	-	-	-	-	3,222,288.35	3,222,288.35
පෙර වර්ෂයේ ගැළපීම	-	-	-	-	602,251.32	602,251.32
2020.01.01 දිනට ශේෂය	**27,000,000.00**	**-**	**1,268,018.00**	**-**	**(15,650,314.53)**	**12,617,703.47**
දායකත්ව ප්‍රාග්ධනය/ අරමුදල	23,200,000.00	-	-	-	-	23,200,000.00
සාමාජික මුදල් ශුද්ධ ආදායම 2021	-	-	(10,000.00)	-	-	(10,000.00)
2021 වසරේ අතිරික්තය/ ඌනතාවය	-	-	-	-	3,543,062.69	3,543,062.69
පෙර වර්ෂයේ ගැළපීම	-	-	-	-	701,000.00	701,000.00
2021.12.31 දිනට ශේෂය	**50,200,000.00**	**-**	**1,258,018.00**	**-**	**(11,406,251.84)**	**40,051,766.16**
ආරම්භක ශේෂය ගැළපීම	-	-	-	-	(1,010,414.63)	(1,010,414.63)
සාමාජික මුදල් ශුද්ධ ආදායම 2022	-	-	-	-	-	-
2022 වසරේ අතිරික්තය/ ඌනතාවය	-	-	-	-	(3,978,820.06)	(3,978,820.06)
ප්‍රත්‍ය ගණන සංචිත අතිරික්ත	-	-	-	508,049.08	-	508,049.08
2022.12.31 දිනට ශේෂය	**50,200,000.00**	**-**	**1,258,018.00**	**508,049.08**	**(16,395,486.53)**	**35,570,580.55**

තුරුසවිය අරමුදල		
2022 දෙසැම්බර් 31න් අවසන් වූ වසර සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය		
	2022 (රු.)	**2021 (රු.)**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් වූ මුදල් ප්‍රවාහයන්		
සාමාන්‍ය ක්‍රියාකාරකම්වලින් අතිරික්ත /ඌනතාවය	(3,978,820.06)	3,543,062.69
පෙර වර්ෂයේ ගැලපුම්	(1,010,414.63)	701,000.00
අඩු කිරීම් :		
පොලී ආදායම	(1,535,953.68)	(498,743.70)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මූල්‍ය ප්‍රවාහය	**(6,525,188.36)**	**3,745,318.99**
මුදල් නොවන වෙනස් වීම්		
ක්ෂය වීම්	3,225,536.64	4,969,043.51
සංචිත	508,049.08	-
පාරිතෝෂික සඳහා වෙන් කිරීම්	606,945.65	(2,659,000.10)
වෙළඳ හා අනෙකුත් ලැබීම්	(482,427.67)	71,706.24
තොගයෙහි අඩු වැඩි බව	(1,193,036.61)	1,270,103.71
ගෙවිය යුතු වියදම් හි අඩු වැඩි බව	1,002,385.06	(727,576.48)
උපචිත ආදායම්	1,155,874.20	(1,155,874.20)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ශුද්ධ ප්‍රවාහය	**(1,701,862.01)**	**5,513,721.67**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් මූල්‍ය ප්‍රවාහය		
දේපළ පිරියත හා උපකරණ	1,336,596.17	(399,778.00)
පොලී ලැබීම්	840,536.78	494,126.23
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මූල්‍ය ප්‍රවාහය	**2,177,132.95**	**94,348.23**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මූල්‍ය ප්‍රවාහය		
සාමාජික මුදල් දායකත්වය	-	(10,000.00)
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මූල්‍ය ප්‍රවාහය	**-**	**(10,000.00)**
ශුද්ධ මූල්‍ය වැඩි වීම/අඩු වීම මුදල් හා මුදල්වලට සමාන දෑ	475,270.94	5,598,069.90
කාලපරිච්ඡේදය ආරම්භයේ දී මුදල් හා මුදල්වලට සමාන දෑ	21,865,251.08	16,267,181.18
කාලපරිච්ඡේදය අවසානයේ දී මුදල් හා මුදල්වලට සමාන දෑ	**22,340,522.02**	**21,865,251.09**

තුරුසවිය අරමුදල

2022.12.31 දිනට අයවැය සහ කාර්යසාධනය

ආදායම	සත්‍ය(රු.)	අයවැය ගත රු.	ප්‍රගතිය
රජයේ ප්‍රදාන ප්‍රාග්ධන	8,320,000.00	18,000,000.00	46.22%
රජයේ ප්‍රදාන පුනරාවර්තන	27,725,000.00	29,000,000.00	95.60%
අනෙකුත් ආදායම්	1,630,653.68	-	
මුළු ආදායම් එකතුව	**37,675,653.68**	**47,000,000.00**	**80.16%**
පුනරාවර්තන වියදම්			
වැටුප්, වේතන හා සේවක ප්‍රතිලාභ	19,417,548.98	19,224,000.00	101.01%
ගමන් වියදම්	109,185.15	276,000.00	39.56%
සැපයුම් හා පාරිභෝගික වියදම	9,365,387.43	9,500,000.00	98.58%
අනෙකුත් වියදම්	197,868.59	-	0.00%
ක්ෂය වීම්	5,110,181.89	-	0.00%
පුනරාවර්තන වියදම් එකතුව	**34,200,172.04**	**29,000,000.00**	**117.93%**
ප්‍රාග්ධන වියදම්			
සංවර්ධන වියදම්	2,696,844.19	10,650,000.00	25.32%
දුම් ගෙවල් ව්‍යාපෘතිය	779,459.00	3,000,000.00	25.98%
කිරි කැපුම් ව්‍යාපෘතිය	3,880,819.91	4,250,000.00	91.31%
සේවක පුහුණුව	97,178.60	100,000.00	97.18%
ප්‍රාග්ධන වියදම් එකතුව	**7,454,301.70**	**18,000,000.00**	**41.41%**
වියදම්වල එකතුව			
ප්‍රාග්ධන	7,454,301.70	18,000,000.00	41.41%
පුනරාවර්තන	34,200,172.04	29,000,000.00	117.93%
එකතුව	**41,654,473.74**	**47,000,000.00**	**88.63%**

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශනය

1. තුරුසවිය අරමුදල ආයතනික තොරතුරු

1.1 නෛතික තත්ත්වය හා පිහිටීම

තුරුසවිය අරමුදල ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් 2000 අංක 23 දරන තුරුසවිය අරමුදල පනත මඟින් ස්ථාපිත කරන ලද සංස්ථාවකි. ආයතනයේ ප්‍රධාන කාර්යාලය අංක-39, ශ්‍රී සුභූතිපුර, බත්තරමුල්ල යන ස්ථානයේ පිහිටා ඇත.

1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් හා මෙහෙයුම් ස්වභාවය

(අ) කුඩා රබර් වතු හිමියන්ට ඉතිරි කිරීමේ පුරුද්ද ඇති කරවීම සහ ඔවුන්ගේ සමාජ හා ආර්ථික තත්ත්වය ප්‍රවර්ධනය කිරීම

(ආ) රබර් කර්මාන්තය ආශ්‍රිතව වැදගත් වන ආයෝජන ප්‍රවර්ධනය කිරීම

(ඇ) කුඩා රබර් වතුවල ඵලදාව නිෂ්පාදන බවට පත් කිරීමට අවශ්‍ය රබර් පිරිසැකසුම් ඒකක, රබර් කර්මාන්තශාලා සහ වෙනත් පහසුකම් අත්කර ගැනීම, වැඩි දියුණු කර ගැනීම හෝ පිහිටුවීම.

(ඈ) එවැනි රබර් පිරිසැකසුම් ඒකකවල හෝ කර්මාන්තශාලාවල නිෂ්පාදන අලෙවිය ප්‍රවර්ධනය කිරීම සහ වැඩි දියුණු කිරීම.

(ඉ) කුඩා රබර් වතු සංවර්ධන සමිති (තුරුසවිය සමිති) ලියාපදිංචි කිරීම, විධිමත් කිරීම සහ අරමුදල වෙත ලියාපදිංචි වූ එකී සමිතිවල සාමාජිකයන් සඳහා ආධාර ලබා දීම.

(ඊ) කුඩා රබර් වතුවල රබර් නිෂ්පාදන කටයුතුවල යෙදී සිටින තැනැත්තන්ගේ වැඩි දියුණුව හා යහපත සඳහා අවශ්‍ය වන පියවර ගැනීම.

2. ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්ති

2.1 පොදු ප්‍රතිපත්ති

2.1.1 සකස් කිරීමේ පදනම

ආයතනයේ මූල්‍ය ප්‍රකාශනවලට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය, හිමිකම් වෙනස්වීම් ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, අයවැය ප්‍රකාශය සහ සත්‍ය කාර්ය සාධන ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශයේ සටහන් සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් ඇතුළත් වේ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් සකස් කරන ලද, ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව උපචිත පදනම මත ගිණුම් සකස් කර ඇත.

2.1.2 මිනුම් පදනම

ඓතිහාසික පිරිවැය පරිවර්තන පදනමට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත.

2.1.3 ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය

මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්ම සංකල්පය මත සකස් කර ඇති අතර ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස් නොවී පැවතී ඇත. රජයේ ප්‍රදාන සහ GPC (Group Processing Income)ආදායම, ණය පොලී, ඉතුරුම් ගිණුම් පොලී සහ ස්ථාවර තැන්පතු පොලීවලින් ලැබෙන ආදායමෙන් අරමුදල් ලබා ගත හැක. එවැනි සමුච්චිත අරමුදල් අවශ්‍ය විට සහ ආයතනික වගකීම් ඉටු කිරීමට යොදා ගනී.

මූල්‍ය ප්‍රකාශන සැකසීමේ දී අදාළ වන ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත දක්වා ඇත. මෙම ප්‍රතිපත්ති වෙනත් ආකාරයකින් ප්‍රකාශ නොකළහොත් ඉදිරිපත් කරන ලද සියලුම වසරවල අඛණ්ඩව යෙදී ඇත.

3. වත්කම් තක්සේරු කිරීම සහ ඒවායේ මිනුම් පදනම.

3.1 තොග සත්‍යාපනය

යල්පැන ගිය සහ ක්‍රියාකාරීත්වය අඩු අයිතම සඳහා අඩු කිරීම් ලබා දීමෙන් පසුව, ශුද්ධ උපලබ්ධි අගයෙන් හෝ පිරිවැයෙන් අඩු අගයට තක්සේරු කෙරේ. සාමාන්‍ය ත්ත්වයක් යටතේ තොගය විකිණිය හැකි මිල වනුයේ ශුද්ද උපලබ්ධ අගයයි. තවද ඇස්තමේන්තු පිරිවැය සහ විකිණීම සඳහා ඇස්තමේන්තුගත පිරිවැය ද සැලකිල්ලට ගත යුතුය. වත්මන් ස්ථානයට බඩු තොග ගෙන ඒමේ දී දරන ලද පිරිවැය සහ පහත සඳහන් පිරිවැය සූත්‍රය භාවිතා කර තොගය ගිණුම්ගත කරනු ලැබේ

අමු ද්‍රව්‍ය	-	FIFO (First In First Out) සත්‍ය පිරිවැය පදනම
වැඩ කෙරෙමින් පවතින	-	සෘජු ද්‍රව්‍යවල පිරිවැය, ශ්‍රමය සහ සාමාන්‍ය මෙහෙයුම් ධාරිතාව මත පදනම්ව ස්ථාවර නිෂ්පාදන පොදු කාර්ය පිරිවැයෙන් සුදුසු කොටසක්
නිමි භාණ්ඩ	-	සෘජු ද්‍රව්‍යවල පිරිවැය, ශ්‍රමය සහ සාමාන්‍ය මෙහෙයුම් ධාරිතාව මත පදනම්ව ස්ථාවර නිෂ්පාදන පොදු කාර්ය සඳහා සුදුසු කොටසක්
පරිභෝජන භාණ්ඩ සහ අමතර කොටස්	-	FIFO (First In First Out) සත්‍ය පිරිවැය පදනම.
ඇසුරුම්/ වක්‍ර හා වෙනත් කොටස්	-	FIFO (First In First Out) පදනම මත සැබෑ වියදමින්.

3.2 මුදල් හා මුදල්වලට සමාන ද්‍රව්‍ය

මුදල් සහ මුදල් සමානකම් අර්ථ දැක්වෙන්නේ අතේ ඇති මුදල්, ඉල්ලුම් තැන්පතු සහ කෙටි කාලීන ඉහළ ද්‍රවශීල ආයෝජන, දන්නා මුදල් ප්‍රමාණයට පහසුවෙන් පරිවර්තනය කළ හැකි සහ වටිනාකම වෙනස් වීමේ නොසැලකිය යුතු අවදානමකට යටත්වය.

මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අරමුණ සඳහා මුදල් සහ මුදල් සමාන දෑ අතේ ඇති මුදල් සහ බැංකු අයිරාවල ශුද්ධ බැංකුවේ තැන්පතු වලින් සමන්විත වේ. මුදල් ප්‍රවාහ ප්‍රකාශ වාර්තා කරනු ලබන්නේ වක්‍ර ක්‍රමය මත ය.

3.3 දේපළ පිරියත හා උපකරණ

3.3.1 පිරිවැය / තක්සේරුව

දේපල පිරියත සහ උපකරණ ඓතිහාසික පිරිවැයන් සමුච්චිත ක්ෂයවීම් සහ සමුච්චිත අලාභ හානි ප්‍රකාශ කර ඇත. මෙම ඓතිහාසික පිරිවැයට වත්කමක් එහි අපේක්ෂිත භාවිතය සහ සැලකිය යුතු ප්‍රතිසංස්කරණ සඳහා වැඩ කරන තත්ත්වයට ගෙන ඒම සඳහා සෘජුවම ආරෝපණය කළ හැකි සියලුම පිරිවැය ඇතුළත් වේ.

දේපල පිරියත සහ උපකරණවල අයිතමයක කොටසක් විවිධ ප්‍රයෝජනවත් ජීව කාල ඇති විට, ඒවා දේපල පිරියත සහ උපකරණවල වෙනම අයිතම (ප්‍රධාන සංරචක) ලෙස ගණන් ගනු ලැබේ.

3.3.2 පුනරුත්ථාපන වියදම්

අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභ ප්‍රතිෂ්ඨාපනය කිරීම හෝ නඩත්තු කිරීම සඳහා දේපල පිරියත සහ උපකරණ අළුත්වැඩියා කිරීම හෝ නඩත්තු කිරීම ලෙස දරන ලද වියදම් මුලින් තක්සේරු කරන ලද කාර්ය සඳහා දැරූ විට වියදමක් ලෙස පිළිගැනේ.

3.3.3 ක්ෂය වීම

ක්ෂයවීම් ගණනය කරනු ලබන්නේ ගිණුම්කරණ අරමුණ සඳහා ඉතිරි වටිනාකමක් ඇති එහි ප්‍රයෝජනවත් ආයු කාලය තුළ වත්කම් කපා හැරීමට ඇස්තමේන්තු කර ඇති අනුපාත මත පදනම්ව සරල මාර්ග ක්‍රමය භාවිතා කරමිනි.

ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය සහ වත්මන් සහ සංසන්දනාත්මක කාල පරිච්ඡේද සඳහා භාවිතා කරන ක්ෂයවීම් අනුපාත පහත පරිදි වේ.

පරිගණක උපකරණ	වසර 10ට වැඩි	10%
කාර්යාලයීය ගෘහ භාණ්ඩ	වසර 10ට වැඩි	10%
කාර්යාලයීය උපකරණ	වසර 10 ට වැඩි	10%
යන්ත්‍රෝපකරණ	වසර 05 ට වැඩි	20%
මෝටර් වාහන	වසර 05 ට වැඩි	20%
පරිගණක මෘදුකාංග	වසර 04ට වැඩි	25%

4. වගකීම් හා වෙන් කිරීම්

4.1 ප්‍රතිපාදන

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස අරමුදලට වර්තමාන වගකීමක් (නීතිමය හෝ නිර්මාණාත්මක) ඇති විට ප්‍රතිපාදන පිළිගනු ලැබේ. එහි වගකීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ මූර්තිමත් වන සම්පත් අතිරික්තයක් අවශ්‍ය වන අතර වගකීම් ප්‍රමාණය පිළිබඳව විශ්වාසදායක ඇස්තමේන්තුවක් කළ හැකිය.

.

4.2 විශ්‍රාම ප්‍රතිලාභ පිරිවැය

4.2.1 අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ සැලසුම් - පාරිතෝෂිතය

නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මක් යනු නිශ්චිත දායක සැලැස්මක් හැර වෙනත් පශ්චාත් රැකියා ප්‍රතිලාභ සැලැස්මකි. අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ සැලැස්ම සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන ඇති වගකීම, වාර්තා කරන දිනයේ දී අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ වගකීමේ වර්තමාන වටිනාකම වේ. LKAS - 19 හි සාකච්ඡා කර ඇති පරිදි පාරිතෝෂිත සූත්‍ර ක්‍රමය භාවිතයෙන් නිර්වචනය කරන ලද ප්‍රතිලාභ වගකීම වාර්ෂිකව ගණනය කෙරේ.

SLPSAS 19, “සේවක ප්‍රතිලාභ’’ ට අනුකූලව සියලුම සේවකයින් සඳහා සේවයේ පළමු වසරේ සිට විශ්‍රාම පාරිතෝෂිත සඳහා ප්‍රතිපාදන සලසා ඇත, කෙසේ වෙතත්, 1983 අංක 12 දරන පාරිතෝෂික පනත යටතේ, සේවකයෙකුට වගකීම පැන නගින්නේ වසර 5 ක අඛණ්ඩ සේවා කාලය සම්පූර්ණ වූ පසුව පමණි.
වගකීම බාහිරව අරමුදල් සපයන්නේ නැත
දායක මුදල් ගණනය කිරීම සඳහා මූලික වැටුප සහ ජීවන වියදම් දීමනාව සලකා බලනු ලැබේ.

4.2.2 අර්ථ දක්වා ඇති දායකත්ව සැලසුම් - EPF සහ ETF

අදාළ තත්ත්වය සහ රෙගුලාසි වලට අනුකූලව සේවක අර්ථසාධක අරමුදල් දායක මුදල් සහ සේවක භාර අරමුදල් දායක මුදල් සඳහා සේවකයින් සුදුසුකම් ලබයි. තුරුසවිය අරමුදල විසින් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදලට පිළිවෙළින් සේවක දළ වැටුපෙන් 15% සහ 3% දායක වේ.

4.3 අවිනිශ්චිත වගකීම්

තම කොන්ත්‍රාත් පදනමේ වැටුප් වර්ධක කපා හැරීමට එරෙහිව තුරුසවිය අරමුදලේ කළමනාකරණ සහකාර සේවයේ නියුතු සේවකයින් 5 දෙනෙකු විසින් නඩු පවරා ඇත. කම්කරු විනිශ්චය සභාව දැනට නඩුව විභාග කරයි. කපා හරින ලද වැටුප මුදල් අමාත්‍යාංශයට යවා ඇත. ආයතනය 2022 දෙසැම්බර් 31 දක්වා කිසිදු වෙන් කිරීමක් සිදු කර නොමැත.

5. ආදායම් ප්‍රකාශය

5.1 ආදායම් පිළිගැනීම

5.1.1 රජය සහ අනෙකුත් ප්‍රදාන සහනාධාර

ජාතික අයවැය දෙපාර්තමේන්තුව වාර්ෂික අයවැයෙන් සැලකිය යුතු මුදලක් වෙන් කරයි. SLPSAS 11 ට අනුව ප්‍රාග්ධන ප්‍රදාන වලින් සංවර්ධන වියදම් හැර මිලදී ගත් ප්‍රාග්ධන භාණ්ඩ මගින් ප්‍රාග්ධනීකරණය කරන ලද සහ ප්‍රාග්ධන ප්‍රදානය ආයතනයේ ආදායම ලෙස ආයතනය පිළිගනී.

5.1.2 දේපල බැහැර කිරීමේදී ලාභ හෝ අලාභ

දේපල, කම්හල් සහ උපකරණ බැහැර කිරීමේදී ආදායම් ස්වභාවයේ ලාභ හෝ අලාභ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ ගිණුම්ගත කර ඇත.

5.1.3 පොලී ආදායම උපචිත පදනමක් මත හඳුනා ගැනේ

5.1.4 වෙනත් ආදායම් උපචිත පදනම මත හඳුනා ගැනේ

තුරුසවිය අරමුදල

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ගිණුම් සටහන

1 දේපළ පිරියත හා උපකරණ

1.1 පිරිවැය

වත්කම්	ආරම්භක ශේෂය රු.	වසර තුළ එකතු කිරීම් රු.	ඉවත් කිරීම්/ මාරු කිරීම් රු.	2022.12.31 දිනට ශේෂය රු.
පරිගණක උපාංග	2,438,798.28	19,722.23	197,222.30	2,261,298.21
පරිගණක මෘදුකාංග	578,933.00	-	-	578,933.00
කාර්යාල උපකරණ	1,403,236.00	110,208.78	808,684.90	704,759.88
කාර්යාල ලී බඩු	949,595.13	181,766.98	446,035.87	685,326.24
යන්ත්‍රෝපකරණ	392,702.18	196,351.09	392,702.18	196,351.09
මෝටර් රථ	23,200,000.00	-	-	23,200,000.00
	28,963,264.59	**508,049.08**	**1,844,645.25**	**27,626,668.42**

1.2 ක්ෂය වීම්

වත්කම්	ආරම්භක ශේෂය රු.	වසර තුළ එකතු කිරීම් රු.	ඉවත් කිරීම්/ මාරු කිරීම් රු.	2022.12.31 දිනට ශේෂය රු.
පරිගණක උපාංග	1,072,678.85	224,157.60	197,222.30	1,099,614.15
පරිගණක මෘදුකාංග	217,962.39	144,733.20	-	362,695.59
කාර්යාල උපකරණ	1,016,602.48	52,523.65	808,684.90	260,441.23
කාර්යාල ලී බඩු	657,196.64	48,767.40	446,035.87	259,928.17
යන්ත්‍රෝපකරණ	392,702.18	-	392,702.18	-
මෝටර් රථ	4,534,623.69	4,640,000.04	40,000.00	9,134,623.73
	7,891,766.23	**5,110,181.89**	**1,884,645.25**	**11,117,302.87**

		2022 රු.	2021 රු.
1.3	**පොත්වල ශුද්ධ අගය**	**16,509,365.55**	**21,071,498.36**

		2022 රු.	2021 රු.
2	**මුදල් හා මුදල්වලට සමාන වස්තු**		
	බැංකු ගිණුම් අංකය : 014100163254138	-	10,895,132.60
	බැංකු ගිණුම් අංකය : 208100123254138	261,766.76	-
	මහජන බැංකු ඉතිරි කිරීමේ ගිණුම	-	1,313,532.80
	මහජන බැංකු ඉතිරි කිරීමේ ගිණුම	1,625,383.84	-
	ස්ථාවර තැන්පතු	20,453,371.43	9,656,585.69
		22,340,522.03	**21,865,251.09**
3	**වෙළඳ හා වෙනත් ලැබීම්**		
	රබර් ෂීට් මිල දී ගැනීමට අත්තිකාරම්	490,472.26	490,472.26
	තරාදි ණය	242,275.00	242,275.00
	ඩයමන්ඩ් රෝල් ණය	93,362.50	93,362.50
		826,109.76	**826,109.76**

		2022	2021
		(රු.)	(රු.)
	මුද්දර අත්තිකාරම්	-	890.00
	තැන්පතු	6,500.00	6,500.00
	ඉන්ධන අත්තිකාරම්	100,000.00	25,000.00
	කිරි කැපුම් ව්‍යාපෘතිය් අත්තිකාරම්	691,000.00	-
	අත්තිකාරම්	990,000.00	1,000,000.00
	කරවිට ජනපදය ණය යෝජනා ක්‍රමය	-	200,000.00
	ආපසු ගෙවිය හැකි තැන්පතු	6,000.00	6,000.00
	උපචිත ගොවි සහනාධාර එකතුව 50%	1,561.43	74,243.76
		1,795,061.43	**1,312,633.76**
		2,621,171.19	**2,138,743.52**
			-
	ස්ථාවර තැන්පතු සඳහා උපචිත පොළිය	810,430.49	115,013.59
		810,430.49	**115,013**.59
	වෙළඳ හා වෙනත් ලැබීම් එකතුව	**3,431,601.68**	**2,253,757.11**
4	**උපචිත ආදායම්**		
	උපචිත ප්‍රාග්ධන	-	1,155,874.20
		-	**1,155,874.20**
5	**උපචිත වියදම්**		
	උපචිත විදුලිය	24,080.01	6,526.96
	උපචිත ජලය	11,183.87	3,789.67
	උපචිත ඉන්ධන වියදම්	-	28,992.00
	උපචිත වෙනත් වියදම්	90,529.86	11,160.00
	උපචිත ගමන්	6,575.00	8,975.00
	උපචිත පුහුණු සහ දැනුවත් කිරීමේ වැඩසටහන	-	3,890.32
	උපචිත අතිකාල	20,958.56	3,874.53
	උපචිත සමිති පිහිටුවීම සහ ශක්තිමත් කිරීම	38,942.00	17,722.00
	උපචිත ලිපි ද්‍රව්‍ය සහ කාර්යාල ඉල්ලීම	19,463.18	2,430.00
	උපචිත ආරක්ෂක ගාස්තු	71,920.00	87,850.00
	උපචිත දුම් ගෙවල් ව්‍යාපෘති සහනාධාරය		30,226.04
	උපචිත වාහන නඩත්තු	100,907.00	-
	උපචිත දුරකතන ගාස්තු	10,957.99	-
	උපචිත පිරිසිදු කිරීමේ ගාස්තු	33,650.00	-
	උපචිත කිරි කැපුම් පුහුණු ව්‍යාපෘති වියදම්	45,206.61	-
	උපචිත ප්‍රවාහන වියදම්	3,500.00	-
		477,874.08	**205,436.52**
6	**රජයේ ප්‍රදාන**		
	ප්‍රාග්ධන	8,320,000.00	18,000,000.00
	පුනරාවර්තන	27,725,000.00	31,290,166.46
		36,045,000.00	**49,290,166.46**

		2022 (රු.)	2021 (රු.)
7	**වෙනත් ආදායම්**		
	වෙනත් ආදායම්	94,700.00	61,845.43
	රබර් ෂීට් මිල දී ගැනීමේ දායකත්වය	-	26,120.00
	ස්ථාවර තැන්පතු සඳහා වාර්ෂික පොළිය	1,492,202.64	460,110.14
	ඉතිරි කිරීම් සඳහා වාර්ෂික පොළිය	43,751.04	38,633.56
		1,630,653.68	**586,709.13**
8	**වැටුප්, වේතන හා සේවක ප්‍රතිලාභ**		
	වැටුප් වියදම්	11,513,059.82	11,610,943.53
	ජීවන වියදම් දීමනා වියදම්	2,246,400.00	2,308,800.00
	විශේෂ දීමනා වියදම්	2,554,600.00	675,600.00
	සේවක අර්ථ සාධක අරමුදල් ගෙවීම්	1,928,918.97	1,952,961.53
	සේවා නියුක්තිකයන්ගේ අරමුදල් ගෙවීම්	385,783.80	390,592.32
	කළමනාකරණ මණ්ඩල සාමාජික ගාස්තු	120,000.00	99,000.00
	අතිකාල	61,840.74	95,444.74
	පාරිතෝෂික	606,945.65	(2,659,000.10)
		19,417,548.98	**14,474,342.02**
9	**ගමන් වියදම්**		
	ගමන් වියදම්	**109,185.15**	**263,503.40**
		109,185.15	**263,503.40**
10	**පාරිභෝජන ද්‍රව්‍ය හා සැපයුම්**		
	තැපැල් ගාස්තු සහ සන්නිවේදනය	124,610.80	74,684.60
	විදුලි වියදම්	203,715.99	179,686.75
	ජල වියදම්	121,099.52	78,372.31
	මුද්‍රණය, ලිපි ද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා වියදම්	655,921.57	719,532.63
	ඉන්ධන වියදම්	1,833,279.50	887,447.00
	කුලී සහ දේශීය බදු	1,980,000.00	1,980,000.00
	වාහන නඩත්තුව	1,700,997.35	2,740,914.75
	යන්ත්‍රෝපකරණ සහ උපකරණ නඩත්තුව	242,997.50	234,750.00
	ප්‍රවාහන වියදම්	28,500.00	1,200.00
	පුවත්පත් සහ වාර සඟරා	12,010.00	5,760.00
	විගණන ගාස්තුව	500,000.00	400,000.00
	දුරකථන	631,089.97	741,805.28
	ප්‍රවර්ධනය සහ ප්‍රචාරණය	-	132,030.00
	විගණන සහ කමිටු රැස්වීම් වියදම්	90,000.00	58,370.00
	සංග්‍රහ වියදම්	77,113.73	60,962.50
	කාර්යාල නඩත්තුව	12,320.50	42,237.25
	ආරක්ෂක ගාස්තු	776,015.00	1,058,189.50
	පිරිසිදු කිරීමේ සේවා ගාස්තු	375,716.00	351,104.00
		9,365,387.43	**9,747,046.57**

		2022 (රු.)	2021 (රු.)
11	**සංවර්ධන වියදම්**		
	රබර් කිරි එකතු කිරීමේ ප්ලාස්ටික් කෝප්ප සහ කම්බි බෙදා හැරීම	27,506.25	4,000,000.00
	පුහුණු සහ දැනුවත් කිරීමේ වැඩසටහන් වියදම්	541,027.00	603,583.87
	සමිති පිහිටුවීම සහ ශක්තිමත් කිරීමේ වියදම්	1,354,147.19	495,527.40
	කිරි පිහි බෙදා හැරීමේ වියදම්	691,645.00	-
	රබර් කිරි මුදවීමේ භාජන බෙදා හැරීම	27,506.25	2,095,081.10
	ඩයමන්ඩ් සහ සිනිඳු රෝල් යුගල බෙදා හැරීම	27,506.25	6,993,500.00
	ගම් මට්ටමේ කුඩා රබර් වතු හිමියන් සවි බල ගැන්වීම	-	320,000.00
	කාර්යය මණ්ඩල පුහුණුව	97,178.60	99,929.00
	රබර් කිරි පෙරන වියදම්	27,506.25	-
		2,794,022.79	**14,607,621.37**
12	**වෙනත් වියදම්**		
	බැංකු ගාස්තු	17,317.39	36,444.00
	වෙනත් වියදම්	157,551.20	203,728.48
	නවාතැන් ගාස්තු	23,000.00	-
		197,868.59	**240,172.48**

මගේ අංකය
எனது இல.
My No. PAL/E/TSF/01/22/ 04

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 2023 ජූනි 21 දින

සභාපති
තුරුසවිය අරමුදල

තුරුසවිය අරමුදලේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

තුරුසවිය අරමුදලේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2000 අංක 23 දරන තුරුසවිය අරමුදල පනතේ, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොළුදුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொலதுவ வீதி, பத்தரமுல்ல, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34
+94 11 2 88 72 23
ag@auditorgeneral.gov.lk
www.naosl.gov.lk

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය

ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අරමුදල පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අරමුදලට සම්බන්ධවී යම් ගිවිසුමක්

සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති / විධානවලට යොමුව	නිරීක්ෂණ
(අ) 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 9.1 ඡේදය	අතුරු අග්‍රිමයන් එය දෙන ලද කාර්යයන් නිම කර දින 10ක් ඇතුළත පියවිය යුතු වුවද, ආයතනය විසින් 2022 වර්ෂයේදී ලබා දී තිබුණු එකතුව රු.174,530ක් වටිනා තත්කාර්යය අතුරු අග්‍රිම 12ක් පියවීම සඳහා දින 14ත්, දින 271ත් අතර කාලයක් ප්‍රමාද වී තිබුණු අවස්ථා විගණනයේ දී නිරීක්ෂණය විය.
(ආ) 2016 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 30/2016 හි 3.3 ඡේදය	චක්‍රලේඛය ප්‍රකාරව ඉන්ධන පරීක්ෂාවක් සිදුකර නොතිබුණි.
(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය අංක 1645(අ)	සෑම වාහනයක් සඳහාම ක්‍රමවත් හා විධිමත් ලෙස සම්පූර්ණ කර වාහන ලොග් සටහන් පොත් පවත්වාගෙන යා යුතු වුවත් වාහන තුනකට අදාළව ලොග් පොත් පවත්වාගෙන ගොස් නොතිබුණි. එසේම පවත්වාගෙන ගොස් තිබුණු ලොග් පොත්වලද වාහන පිළිබඳ විස්තර, ඉන්ධන දහනය, අලුත්වැඩියාවන් පිළිබඳ විස්තර ඇතුළත් කර නිසි පරිදි සම්පූර්ණ කර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

2.3 වෙනත් විගණන නිරීක්ෂණ

(අ) අරමුදල වෙත පරිත්‍යාග වශයෙන් 2018 වර්ෂයේදී වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයෙන් ලැබුණු ලී බඩු උපකරණ ඒකක 89ක අගය තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනයට ඇතුළත් කර නොතිබුණි.

(ආ) තුරුසවිය අරමුදල යටතේ දිස්ත්‍රික්ක 13 ක තුරුසවිය සමිති 818ක් ලියාපදිංචි කර තිබුණු නමුත් සමාලෝචිත වර්ෂය අවසානයට සමිති 293ක් අක්‍රීය තත්ත්වයේ පැවතුණි.

(ඇ) තුරුසවිය අරමුදල මඟින් කළුතර, කෑගල්ල, රත්නපුර සහ ගම්පහ යන දිස්ත්‍රික්ක 04 හි තුරුසවිය සමිති 31 ක් සඳහා ලබාදී ඇති අත්තිකාරම් සහ ණය මුදල්වලින් වර්ෂ 05කට වැඩි කාලයක සිට ලැබිය යුතු එකතුව රු.826,109 ක ශේෂයක් අයකර ගෙන නොතිබුණි.

(ඈ) 2020 වර්ෂයේ දී ජනාධිපති ලේකම් කාර්යාලයෙන් අරමුදල වෙත ලැබුණු අංක 65-1090 දරන ජීප් රථය අලුත්වැඩියාව සඳහා 2021 නොවැම්බර් මාසයේ ගරාජයකට බාර දී තිබුණු නමුත් 2023 මැයි මාසය දක්වා රථයේ අලුත්වැඩියා කටයුතු නිමකර කාර්යාලයට රැගෙනවිත් නොතිබුණි.

(ඉ) 2020 ජනවාරි 05 දින ජනාධිපති ලේකම් කාර්යාලයෙන් තුරුසවිය අරමුදල වෙත ලැබී තිබුණු KW-3039 දරන පෝජෝ කාර් රථය රැගෙන ආ දිනයේ සිට ධාවන තත්ත්වයේ නොතිබුණු අතර වාහන අලුත්වැඩියාව සඳහා ප්‍රමාණවත් මුදලක් වෙන්කර නොමැති බැවින් අලුත්වැඩියා කිරීමට කටයුතු නොකර වසර තුනකට වැඩි කාලයක් තුරුසවිය අරමුදල පරිශ්‍රයේ ගාල්කර තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය තුළදී රු.3,000,000ක ඇස්තමේන්තු වටිනාකමක් සහිත ඉහළ ඵලදායිතාවයෙන් හා කාර්යක්ෂමතාවයෙන් යුතු දුම් ගෙවල් 20ක් ඉදිකිරීමට ඉලක්ක කර තිබුණු නමුත් වර්ෂය අවසාන වන විට තුරුසවිය සමිති විසින් දුම් ගෙවල් 12ක් පමණක් ඉදිකර තිබුණි.

(උ) 2021 වර්ෂයේ දී තුරුසවිය සමිති සාමාජිකයින් වෙත සියයට 50ක සහනාධාරයක් මත බෙදාදීමට කිරිපිහි 4000ක් මිලදී ගෙන තිබුණි. සමාලෝචිත වර්ෂයේ දී තුරුසවිය සමිති වෙත පිහි 1,740ක් පමණක් බෙදා හැර තිබුණු අතර, පිහි 150ක් 2023 වර්ෂයේ පුහුණු වැඩසටහන් සඳහා ද නිකුත් කිරීමෙන් පසුව තොග පොතට අනුව 2023 පෙබරවාරි 01 දිනට කිරිපිහි ශේෂය 2,110 ක් වුවද , එදින භෞතික විගණන පරීක්ෂාවේදී කිරිපිහි 1,989ක් පමණක් ඉතිරිවී තිබුණි. ඉතිරි කිරි පිහි 121ක් නිකුත් කිරීමට අදාළ ලිඛිත සාක්ෂියක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. රු.1,680,705ක් වටිනා කිරිපිහි 1,989ක තොගය උඩුමහලේ එළිමහන් කොටසේ රඳවා තැබීම හේතුවෙන් ඒවා මළ බැඳී දිරාපත් වී භාවිතා කළ නොහැකි තත්ත්වයට පත් වී තිබුණු අතර ගින්නෙන්, සොරා ගැනීමෙන්, දිරාපත්වීමෙන් හා අපතේ යාමෙන් තොග හානි සිදුවීම වැළැක්වීමට වගකිව යුතු නිලධාරීන් විසින් මු.රෙ.751(5) ප්‍රකාර නිසි පියවර ගෙන නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති